ප්‍රදානයක් කිරීම සම්බන්ධයෙන් සහ ඒ වියදම් පියවීම පිණිස පළාතේ පළාත් සභා අරමුදලින් මුදල් විසර්ජනය කර ගැනීමට බලය ලබා ගැනීම සඳහා සෑදිය යුතු ප්‍රඥප්තිය සම්බන්ධයෙන් බලපැවැත්වෙන්නා වූ ආකාරයෙන් ම බලපැවැත්වෙන්නේ ය.

පළාත් සභාව විසින් අනුමත කිරීම බලාපොරොත්තු වෙන් වියදම් සඳහා බලය දීම.

**30.** මේ කොටසේ මීට පූර්වයෙන් ඇති විධිවිධානවල කුමක් සඳහන් වුවද, පළාතේ පළාත් සභා අරමුදල සංස්ථාපනය කළ දිනයෙන් ආරම්භ වන මාස හයකට නොවැඩි කාල සීමාවක් සඳහා අවශ්‍යයැයි ආණ්ඩුකාරවරයා සලකන වියදමක්, ඒ වියදම් පළාත් සභාව විසින් අනුමත කිරීම බලාපොරොත්තුවෙන්, පළාතේ පළාත් සභා අරමුදලින් දැරීමට, ආණ්ඩුකාරවරයා විසින් බලය දිය හැකිය.

## IV වන කොටස

## පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව

ප්‍රධාන ලේකම්වරයා.

**31.** ජනාධිපතිවරයා විසින් එක් එක් පළාතේ ප්‍රධාන අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව එම පළාතේ ප්‍රධාන ලේකම්වරයා පත් කළ යුත්තේ ය.

පළාත් සභා රජයේ සේවය.

32. (1) මෙහි පහත දැක්වෙන නීතියක විධිවිධානවලට යටත්ව එක් එක් පළාතේ පළාත් සභා රජයේ සේවයේ නිලධරයන් පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ, ඔවුන්ගේ විනය පාලනය මෙයින් එම පළාතේ ආණ්ඩුකාරවරයා සතු කරනු ලබන්නේ ය.

(2) පළාතක ආණ්ඩුකාරවරයා විසින්, පළාත් සභා රජයේ සේවයේ නිලධරයන් පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය සම්බන්ධයෙන් වූ ස්වකීය බලතල කලින් කල එම පළාතේ පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවට පවරා දෙනු ලැබිය හැක්කේ ය.

(3) පළාත් සභා රජයේ සේවයේ නිලධරයන් බඳවා ගැනීමේ පටිපාටි නියම කිරීම සහ ඒ නිලධරයන්ගේ පැවැත්ම පිළිබඳ රීතිමාලා නියම කිරීම ද උසස් කිරීම් සහ මාරු කිරීම් සිදුකිරීමේ දී අනුගමනය කළ යුතු ප්‍රතිපත්ති නියම කිරීම ද ඒ නිලධරයන් පත් කිරීම, මාරු කිරීම, සේවයෙන් පහ කිරීම සහ ඔවුන්ගේ විනය පාලනය යන මේ කරුණු පිළිබඳව බලතල ක්‍රියාත්මක කිරීමේ පටිපාටිය හා එකී බලතල පවරාදීමේ පටිපාටිය නියම කිරීම ද ඇතුළුව පළාත් සභා රජයේ සේවයේ නිලධරයන්ට අදාළ සියලු කරුණු පිළිබඳව විධිවිධාන සැලැස්වීම හා ඒ කරුණු තීරණය කිරීම ආණ්ඩුකාරවරයා විසින් කරනු ලබන්නේය. බඳවා ගැනීමේ පටිපාටි සහ පැවැත්ම පිළිබඳ රීතිමාලා නියම කිරීමේ දී ආණ්ඩුකාරවරයා විසින්, රජයේ සේවයේ අනුරූප ධුර සඳහා නියමිත බඳවා ගැනීමේ පටිපාටි සහ රජයේ සේවයේ අනුරූප ධුර දරන නිලධරයන් සඳහා නියමිත පැවැත්ම පිළිබඳ රීතිමාලා හැකිතාක් දුරට අනුගමනය කළ යුත්තේ ය.

පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාව.

33. (1) එක් එක් පළාතේ ආණ්ඩුකාරවරයා විසින් පත් කරනු ලබන තැනැත්තන් තුන් දෙනකුට නොඅඩු සංඛ්‍යාවකින් සමන්විත පළාත් සභා රාජ්‍ය සේවා කොමිෂන් සභාවක් ඒ ඒ පළාත සඳහා වන්නේ ය. ආණ්ඩුකාරවරයා විසින් කොමිෂන් සභාවේ සාමාජිකයන් අතුරෙන් එක් සාමාජිකයකු කොමිෂන් සභාවේ සභාපතිවරයා ලෙස නම් කළ යුත්තේ ය.